# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2017 අංක 27 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2017 නොවැම්බර් මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2017 නොවැම්බර් මස 17 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 4.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2017 අංක 27 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2017 නොවැම්බර් මස 17 වන දින]

එල්.ඩී.— ඕ. 48/2016

**2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2017 අංක 27 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 2015 අංක 4 දරන පනතේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "ශ්‍රී ලංකාව තුළ" යන වචන වෙනුවට "ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

> "(1අ) (1) වන උපවගන්තිය යටතේ යම් අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ යම් සාක්ෂියක් හෝ ප්‍රකාශයක් ශ්‍රී ලංකාවෙන් පිටත යම් දුරස්ථ ස්ථානයක දී ලබා ගැනීමට අවශ්‍ය වන අවස්ථාවක දී, ඒ අපරාධයේ වින්දිතයා හෝ සාක්ෂිකරු සාක්ෂි දීමට හෝ ප්‍රකාශය කිරීමට බලාපොරොත්තු වන්නා වූ රටෙහි ශ්‍රී ලංකා රජයේ දූත මණ්ඩල කාර්යාලයේ දී එය වාර්තාගත කරනු ලැබිය යුතු ය." ; සහ

(3) එම වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

2—PL 005338 -2862 (2017/07)

"(4) මේ වගන්තියේ කාර්ය සඳහා —

(අ) "අධිකරණය" යන්නෙන්, අපරාධ නඩු කටයුතු පවත්වන්නා වූ අධිකරණයක් අදහස් වේ ; සහ

(ආ) "රජයේ නිලධරයා" යන්නට, ශ්‍රී ලංකා විදේශ සේවයේ සේවය කරන නිලධරයෙක් ද ඇතුළත් වේ.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.